රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 09/94

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994.02.08.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් ලෙස සේවය කිරීම
සඳහා ගෙවීම්.

1986.05.08 දිනැති අංක.328 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි අනුමත කරන ලද ගෙවීම් පහත සඳහන් අයුරු සංශෝධනය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (I) | මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක්/තනතුරු සඳහා පුද්ගලයෙකු/පුද්ගලයන් පත් කිරීම සඳහා තෝරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | - | සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන එක් පුද්ගලයෙකු සඳහා රු.15/- (රුපියල් පහලොව) බැගින්. |
| (II) | මාණ්ඩලික ශ්‍රේණි ඇතුලත, ශ්‍රේණියක සිට ශ්‍රේණියකට උසස් කිරීම සඳහා නිලධරයකු/නිලධරයන් තෝරා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | - | සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන එක් නිලධාරියකු සඳහා රු.10/- (රුපියල් දහය) බැගින්. |
| (III) | මාණ්ඩලික නොවන ශ්‍රේණියේ තනතුරකට පුද්ගලයෙකු/පුද්ගලයන් පත් කිරීම සඳහා හෝ මාණ්ඩලික නොවන ශ්‍රේණිය ඇතුලත උසස් කිරීම සඳහා නිලධරයෙකු/නිලධරයන් තෝරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයකුටම. | - | සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරන එක් නිලධාරියකු සඳහා රු.5/- (රුපියල් පහ) බැගින්. |
| (IV) | සුළු සේවක ශ්‍රේණියේ තනතුරකට පුද්ගලයෙකු/පුද්ගලයන් පත් කිරීම සඳහා හෝ සුළු සේවක ශ්‍රේණි ඇතුලත උසස් කිරීම සඳහා නිලධරයෙකු/නිලධරයන් තෝරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | - | සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන එක් පුද්ගලයෙකු සඳහා රු.2/- (රුපියල් දෙක) බැගින්. |

මෙම ගෙවීම් 1993 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන අතර මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය